# කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය

## ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා බදු පදනම මත පරිශ්‍රයක් ලබා ගැනීම

ලංසු අංකය: NIPO/09/2017

1. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා බදු පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරන ලද ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

2. ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ ලංසු කැඳවීම සිදුකරනු ලැබේ.

3. බදු පදනම යටතේ ලබා ගැනීමට අපේක්ෂා කරන කාර්යාල පරිශ්‍රය, පහත සඳහන් අවම මූලික සුදුසුකම් සපුරා තිබිය යුතුය.
   - පිහිටීම: කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය/ බත්තරමුල්ල/රාජගිරිය ප්‍රධාන මාර්ගයේ හෝ අතුරු මාර්ගයක නම්, ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 200ක් පමණ දුරින් පිහිටීම හා ප්‍රවේශ මාර්ගය අඩි 20ක් පමණ පළල් වීම
   - අවශ්‍ය ඉඩකඩ ප්‍රමාණය: වර්ග අඩි 12,000 සහ වර්ග අඩි 15,000 අතර වායු සමීකරණය කළ අනිකුත් අවශ්‍ය පහසුකම් ද සහිත ගොඩනැගිල්ලක් විය යුතුය. එකී ඉඩ පහසුකම කාර්යාලීය කාමර, සම්මන්ත්‍රණ ශාලාව, පිළිගැනීමේ කටයුතු සඳහා භාවිතා කරන ඉඩ පහසුකම් ආදී වශයෙන් වෙන් කළ හැකිවිය යුතු අතර අදාළ ඉඩ ප්‍රමාණ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට අවස්ථෝචිතව වෙනස් කර ගැනීමේ හැකියාව ද තිබිය යුතුය. එවැනි අවශ්‍ය වෙනස් කර ගැනීම් සිදු කර ගැනීම සඳහා ගොඩනැගිලි හිමිකරුගේ එකඟතාවය ලබා දිය යුතුය.
   - රථ ගාල: එකවර අවම වශයෙන් වාහන 10ක් නවතා තැබීම සඳහා පහසුකම් තිබිය යුතුය.
   - බදු කාලය: වසර පහ (05) කි. ( අලුත් කළ හැකිය.)

4. ආපසු නොගෙවන රු.3500.00 මුදලක් මුදලින් ගෙවීමෙන් අනතුරුව, කොළඹ 10, ඩී.ආර්.විජේවර්ධන මාවතේ, අංක 400, සමාගම් මැදුරේ 3 වන මහලේ පිහිටි ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙන් ලංසු කැඳවීමේ ලේඛන ලබාගත හැක. 2017 සැප්තැම්බර් මස 11 වන දින සිට 20 වන දින තෙක් සතියේ රාජකාරි දිනවල පෙ.ව. 8.30 සිට ප.ව.3.00 දක්වා ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කරනු ලැබේ.

5. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන පිටපත් 02කින් යුක්තව ("මුල් පිටපත" සහ "පිටපත" යනුවෙන් පැහැදිලිව සළකුණු කර) 2017 සැප්තැම්බර් මස 21 වන දින ප.ව. 2.30ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කොළඹ 10, ඩී.ආර්.විජේවර්ධන මාවතේ, සමාගම් මැදුරෙහි 2 වන මහලේ පිහිටා ඇති ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ, ගණකාධිකාරී නිලකාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම සිදුකළ යුතුය. "ගොඩනැගිලි ඉඩකඩ බදුදීම සඳහා ලංසුව"

මැයෙන් ලංසු ලේඛන බහාලන ලියුම්කවරයේ වම්පස ඉහළ  කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රමාද ව ලැබෙන ලංසු භාර නොගන්නා අතර, ඒවා විවෘත නොකර ආපසු එවනු ලැබේ. ලංසු කැඳවීමේ වේලාව අවසන් වූ වහාම, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයයත් නියෝජිතයන් ඉදිරිපිට ලංසු විවෘත කරනු ලැබේ.

6. අදාළ සුදුසුකම් සපුරන ලංසුකරු තෝරා ගැනීම සම්බන්ධ අවසාන තීරණය ගැනීමේ බලය ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

7. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් තොරතුරු ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

- අධ්‍යක්ෂ ජනරාල් : 0112669179
- ගණකාධිකාරී : 0112669177
- පරිපාලන නිලධාරී : 0112688768

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය,
03 වන මහල, “සමාගම් මැදුර”,
නො.400, ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ 10.